*සැ. යු.-* 2021.01.29 දින අංක 2213 දරන ගැසට් පත්‍රයේ I, II, III, IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,214 - 2021 පෙබරවාරි මස 05 වැනි සිකුරාදා - 2021.02.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | -- | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 224 |

*සැ. යු.*-(i) විවාහ (සාමාන්‍ය) (සංශෝධන) පනත් කෙටුම්පත 2021 ජනවාරි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) මුස්ලිම් විවාහ හා දික්කසාද (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත 2021 ජනවාරි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 පෙබරවාරි මස 25 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 පෙබරවාරි මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

221 B 82201 — 5,403 (2021/01)
B 1 -

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ග යෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කැලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය

### ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කරගැනීම - 2020/2021

09.10.2020 දින අංක 2197 දරන ගැසට් නිවේදනයේ ජාතික තාක්ෂණික ඩිප්ලෝමා පාඨමාලාවේ 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා සුදුසුකම් ලත් අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවීමට අදාළ අංක 03, තෝරාගැනීමේ පදනම/ක්‍රියාපටිපාටිය හා බැඳේ.

රටතුළ දැනට පවතින කොවිඩ්-19 වසංගත තත්වය හා සම්බන්ධ කරුණු හේතුවෙන් එහි සඳහන් යෝග්‍යතා පරීක්ෂණය වෙනුවට අයදුම්කරුවන් විසින් ලබාගෙන ඇති Z අගයන් මත පදනම් ව මෙම අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීමට මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය තීරණය කර ඇත. කෙසේ වුවද, අ.පො.ස. (උ.පෙළ) විභාගයේ කුසලතාව හා දිස්ත්‍රික් කුසලතාව මත සිසුන් තෝරාගැනීමේ ක්‍රමවේදය තවදුරටත් එලෙසම පවතිනු ඇත.

තවද, ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පරීක්ෂණය පසුව එළඹෙන දිනයකදී පැවැත්වීමටද තීරණය කර ඇත.

නිසි බලධාරි,
මොරටුව විශ්වවිද්‍යාලයීය තාක්ෂණික ආයතනය.

02-23

---

### ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ස්ථානාධිපති තනතුරේ - III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත ලිඛිත තරග විභාගය - 2019 - (2020)

කොවිඩ් වසංගතය හේතුවෙන් රටෙහි පවතින අයහපත් වාතාවරණය සලකා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය ස්ථානාධිපති තනතුරේ III ශ්‍රේණියේ පුරප්පාඩු පිරවීම සඳහා අංක 2,187 - 2020 ජූලි මස 31 වන දින ගැසට් නිවේදනයේ පල කරන ලද අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය 2021.03.05 දින දක්වා දීර්ඝ කරන ලදී. ඒ අනුව එම අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

එම්. ජේ. ඩී. ප්‍රනාන්දු,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2021 ජනවාරි මස 21 වැනි දින,
දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය,
කොළඹ 10.

02- 25

**තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය**

ජාතික යොවුන් සේනාංකය

**2021 අධ්‍යයන වර්ෂය පළමු අදියර ආධුනිකයන් බඳවා ගැනීම සඳහා අයදුම් කිරීම**

ජාතික යොවුන් සේනාංකයේ දිවයින පුරා පිහිටි ජාතික යොවුන් සේනාංක මධ්‍යස්ථාන තුළ 2021 වර්ෂයේ පළමු අදියර පාඨමාලාව (මෘදු කුසලතා) සඳහා බඳවා ගැනීම් සිදු කෙරේ. මෙම පාඨමාලාව නේවාසික නොවන පූර්ණ කාලීන නොමිලේ පවත්වන පාඨමාලාවකි.

*පාඨමාලා සඳහා අයදුම් කිරීම :*

ජාතික යොවුන් සේනාංක පුහුණු පාඨමාලාව පැවැත්වෙන මධ්‍යස්ථාන පහත දක්වා ඇත. ඔබ කැමති මධ්‍යස්ථානය තෝරාගෙන අදළ දිස්ත්‍රික්කයේ ජාතික යොවුන් සේනාංක පුහුණු ආයතනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ පහත දක්වා ඇති විද්‍යුත් ලිපිනයට යොමුකළ යුතුය. අයදුම්පත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කිරීමේ දී ලිපි කවරයේ වම්පස ''2021 අධ්‍යයන වර්ෂය පළමු අදියර'' යනුවෙන් සඳහන් කොට ඉදිරිපත් කළ යුතු අතර විද්‍යුත් තැපැලට යොමු කිරීමේ දී විද්‍යුත් තැපෑලෙහි විෂය යන ස්ථානයට 2021 වර්ෂය පළමු අදියර ලෙස සඳහන් කල යුතුය. **2021 පෙබරවාරි මස 11 වැනි දින අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වේ.**

| | | |
|---|---|---|
| වැඩි විස්තර සඳහා | - | ඔබට ආසන්නතම පුහුණු මධ්‍යස්ථානය හෝ පහත දුරකථන අංකයන්ට අමතන්න |
| දුරකතන අංක | - | 011-2688885<br>071-0377377 |
| ෆැක්ස් අංකය | - | 011-2684784 |
| ඊ-මේල් ලිපිනය | - | media@YouthCrops.lk |
| වෙබ් ලිපිනය | - | www.youthcorps.lk |
| ෆේස්බුක් පිටුව | - | www.Facebook.com/OfficialNationalyouthcrops |
| ප්‍රධාන කාර්යාලය | - | අංක 420,<br>බෞද්ධාලෝක මාවත,<br>කොළඹ 07. |

සභාපති/අධ්‍යක්ෂ
ජාතික යොවුන් සේනාංකය.

ජාතික යොවුන් සේනාංක පාඨමාලාවෙන් ඔබට ලැබෙන ප්‍රතිලාභ

- ඉංග්‍රීසි භාෂාව හා තොරතුරු තාක්ෂණය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් සහතිකයක්.
- ගායන, වාදන, නර්තන, නාට්‍ය හා රංගකලා කුසලතාවන් සඳහා අපෙන් අත්වැලක්.
- ඔබ තෝරාගත් වෘත්තීය පුහුණු පාඨමාලාවක් සඳහා යොමු කෙරේ.
- දක්ෂතා ඇති පුහුණුලාභීන් හට සුවිශේෂී පාඨමාලා සඳහා පූර්ණ ශිෂ්‍යත්වයක් පිරිනැමේ.

ජාතික යොවුන් සේනාංක පාඨමාලාවේ සංයුතිය

- ඉංග්‍රීසි භාෂාව හා කථනය
- දමිළ භාෂාව හා කථනය
- සෞන්දර්ය අධ්‍යාපනය
- සරඹ පුහුණුව
- අභියෝගාත්මක ක්‍රියා පුහුණුව
- වෘත්තිය මාර්ගෝපදේශනය සහ පෞරුෂ සංවර්ධනය
- පුද්ගල නායකත්ව පුහුණුව
- තොරතුරු තාක්ෂණය

රේන්ජර් තොරතුරු එක්රැස් කිරීම

**ජාතික යොවුන් සේනාංකය**

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

දිස්ත්‍රික්කය/மாவட்டம்/District : ප්‍රා. ලේ. කොට්ඨාසය/பிரதேச செயலகம்/Divisional Secretariat
දු. අ./தொ. பே. இல./Tel. :

1. මුලකුරු සමග නම/முதல் எழுத்துக்களுடன் பெயர்/Name with Initials :-

2. සම්පූර්ණ නම/முழுப்பெயர்/Full Name :-

3. ස්ත්‍රී-පුරුෂ භාවය/பால்/Gender :-

| ස්ත්‍රී/பெண்/Female | | පුරුෂ/ஆண்/Male | |
|---|---|---|---|

4. ජා. හැ. අ./அடையாள அட்டை இலக்கம்/N.I.C. No. :

5. පුරවැසිභාවය/இனம்/Nationality :

6. ආගම/சமயம்/Religion :

7. උපන් දිනය/பிறந்த திகதி/Date of Birth :

| Y | Y | Y | Y | M | M | D | D |
|---|---|---|---|---|---|---|---|

8. වයස/வயது/Age :

9. විවාහක/අවිවාහක/விவாக நிலை/Marital Status :-

| | |
|---|---|
| අවිවාහක/மணமாகாதவர்/Single | |
| විවාහක/மணமானவர்/Married | |

10. රියැදුරු බලපත්‍ර අංකය/சாரதி அனுமதிப்பத்திர இல./Driving License No. :

11. පෞද්ගලික විස්තර/சுயவிபரத் தகவல் /Personal Details :-

a. විද්‍යුත් තැපැල් ලිපිනය/மின்னஞ்சல் முகவரி/E-mail Address :-.............................................

b. ජංගම දු.අ/கைத்தொலைபேசி/Tel (Mobile) :- දු.අ. (නිවස)/தொலைபேசி/Tel (Home) :-

c. ලිපිනය/முகவரி/Address :-

d. දිස්ත්‍රික්කය/மாவட்டம்/District :- ප්‍රා.ලේ. කොට්ඨාසය/பிரதேச செயலகம் /Divisional Secretariat :-

e. ඔබ විශේෂ අවශ්‍යතා ඇති අයෙක් නම් ඒ කුමන තත්ත්වයක් ද යන්න සඳහන් කරන්න. (උදා. ගොළු, අන්ධ . . . .)/ எவ்வகையான மாற்றுத் திறனாளியாக இருக்கிறீர்கள் ? (உம் : வாய் பேச இயலாதவர், பார்வையற்றவர் . . . ./what kind of a differently abled person are you (Speech, Impediment, blind, etc . . . ) ? …………………………

f. භාෂා හැකියාව/மொழித் திறன்கள்/Language Proficiency
භාෂා හැකියාවට අදාළ අංකය සඳහන් කරන්න/மொழித் தேர்ச்சிக்கு உரிய இலக்கத்தை இடவும்/Enter the suitable number for your Language Skills

මූලික /அடிப்படை/Basic - 1 හොඳයි/நன்று/Good-2 දක්ෂ/மிக நன்று/Fluent - 3

| භාෂාව/மொழி/Language | කතා කිරීම/பேச்சு/ Speaking | කියවීම/வாசிப்பு / Reading | ලිවීම/எழுத்து/ Writing | සවන්දීම/கேட்டல்/ Listening |
|---|---|---|---|---|
| ඉංග්‍රීසි/ஆங்கிலம்/English | | | | |
| සිංහල/சிங்களம்/Sinhala | | | | |
| දෙමළ/தமிழ்/Tamil | | | | |

[වැදගත් - ඔබට යම් භාෂාවක් පිළිබඳ කුසලතාවයක් නොමැති නම් ''මූලික'' ලෙස සඳහන් කරන්න.]
[குறிப்பு.- மொழித் தேர்ச்சி அறிவு இல்லையாயின் “அடிப்படை” என்பதை தெரிவுசெய்க.]
[Note-if you don't have knowledge of language you may select 'Basic']

12. උසස් අධ්‍යාපන සුදුසුකම්/உயர் கல்வித் தகைமைகள்/Higher Education Qualifications
(සහතිකපත්‍ර/ඩිප්ලෝමා/උපාධිධාරී/පශ්චාත් උපාධි)
[சான்றிதழ்/டிப்ளோமா/பட்டம்/பட்டப்பின் படிப்பு]
(Certificate/Diploma/Degree/Post Graduate)………………………………………

නිවසේ සිට පුහුණු මධ්‍යස්ථානයට ඇති දුර/வீட்டிலிருந்து பயிற்சி நிலையத்திற்கான தூரம்/Distance from home to Centre :-

පුහුණු කාලය තුළ නවාතැන් පහසුකම් අවශ්‍ය ද? ඔව් நැත
பயிற்சிக் காலத்தினுள் தங்குமிட வசதிகள் தேவைப்படுகின்றதா ? ஆம் இல்லை
Do you need accommodation facilities during the period of training :- Yes No

දුරකථන අංකය/தொலைபேசி/Telephone No. නිවස/மனை/Home ජංගම/கைத்தொலைபேசி/Mobile

ඔබ සතුව බැංකු ගිණුමක් පවතී ද ? ඔව් නැත
வங்கிக் கணக்கொன்றை வைத்துள்ளீர்களா? ஆம் இல்லை
Do you have a bank account ? Yes No

බැංකුව-ශාඛාව/வங்கி-கிளை/Bank-Branch

ගිණුම් අංකය/கணக்கு இல./Account No.

මව, පියා, භාරකරුගේ නම/பெற்றோர்/பாதுகாவலர் பெயர்/Name (Parents/Guardian)

දුරකථන අංකය/தொலைபேசி/Telephone No. නිවස/மனை/Home ජංගම/கைத்தொலைபேசி/Mobile

ඔහුගේ, ඇයගේ පදිංචි ලිපිනය/முகவரி/Address :

අ.පො.ස. උ/පෙ ප්‍රතිඵල/க. பொ. த. உயர் தர பெறுபேறுகள்/G.C.E. A/L Results

වර්ෂය/வருடம்/Year :

විෂය ධාරාව/பிரிவு/Stream :

මාධ්‍ය/ஊடகம்/Medium :

| විෂය/Subject | සාමාර්ථය/Grade |
|---|---|
| | |
| | |
| | |
| | |

අ.පො.ස. සා/පෙළ ප්‍රතිඵල/க. பொ. த. சாதாரண தர பெறுபேறுகள்/G.C.E. O/L Results :

වර්ෂය/ஆண்டு/Year :

| විෂය/Subject | සාමාර්ථය/Grade |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

මූලික කුසලතා/திறன்கள்/Basic Skills :

.......................................................................................................................................

බාහිර කුසලතා/கல்விசாரா செயற்பாடுகள்/Extra-Curricular Activities :

.......................................................................................................................................

අපේක්ෂිත රැකියා/விருப்பமான தொழில்கள்/Preferred Jobs :

..................................................

..................................................

..................................................

අවම වැටුප්

எதிர்பார்க்கும் ஆகக்குறைந்த சம்பளம்

Minimum Salary Expectation :

රැකියා අංශය (අංශ තුනම වුවද තෝරා ගත හැක)/தொழில் பிரிவு (எவ்வகையையும் தெரிவுசெய்ய முடியும்/working section can select any sector as per your wish :-

| | |
|---|---|
| රාජ්‍ය/அரச துறை/Government | |
| පෞද්ගලික/தனியார் துறை/Private | |
| අර්ධ රාජ්‍ය/அரச சார்பு நிறுவனம்/Semi Government | |
| ස්වයං රැකියා/சுயதொழில்/Self Employment | |

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට සහතික වෙමි.
மேற்கூறப்பட்டுள்ள தகவல்கள் யாவும் உண்மையானவை எனவும் சரியானவை எனவும் இத்தாளில் உறுதிப்படுத்துகிறேன்.
I, do hereby acknowledge that the above particulars given by me are true and accurate to the best of my knowledge.

..................
දිනය திகதி/Date

..................
මව/පියා/භාරකරුගේ අත්සන
பெற்றோர் கையொப்பம்.
Parent/Guardian Signature

..................
අයදුම්කරුගේ අත්සන.
விண்ணப்பதாரர் கையொப்பம்.
Applican's Signature

| පළාත | අනු. අංකය | මධ්‍යස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|
| බස්නාහිර පළාත | 1 | කටුනායක | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ධර්මාලෝක මාවත, වලානගොඩ, කටුනායක | 011-2260020 |
| | 2 | යක්කල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය වැරැල්ල වත්තල, යක්කල, ගම්පහ | 033-2233534 |
| | 3 | දිවුලපිටිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වල්පිට, දිවුලපිටිය | 033-2272875 |
| | 4 | බුලත්සිංහල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, බුලත්සිංහල | 034- 2282322 |
| මධ්‍යම පළාත | 5 | අත්තනගල්ල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය | 033-2282232 |
| | 6 | ගම්පොළ | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය නාවලපිටිය පාර, කුඩාමකේ, ගම්පොල | 081-2078177 |
| | 7 | නාඋල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, අරංගල, නාවුල | 066-2246204 |
| | 8 | නුවරඑළිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මීපිලිමාන, අඹේවෙල, නුවරඑළිය | 052-3536332 |
| | 9 | හඟුරන්කෙත | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, රිකිල්ලගස්කඩ, හඟුරන්කෙත | 081-2365849 |
| | 10 | සෙංකඩගල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය සිරිමල් උයන, ඔගස්ටාවත්ත, මහනුවර | 081-2389134 |
| | 11 | යටිනුවර | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මුරුතලාව පාර, දෙහිදෙනිය | 081- 2410026 |
| | 12 | වලපනේ | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, හරස්බැද්ද, වලපනේ | 052-2050010 |

| පළාත | අනු. අංකය | මධ්‍යස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|
| දකුණු පළාත | 13 | සූරියවැව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, පාසල් මාවත, සූරියවැව | 047- 2288169 |
| | 14 | ගාල්ල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය වැකුණුගොඩ, බෝපේ, ගාල්ල | 091- 2233182 |
| | 15 | අකුරැස්ස | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මාරඹේ, අකුරැස්ස | 041-3131216 |
| | 16 | වීරකැටිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, නයිගල, හකුරුවෙල, වීරකැටිය | 047-2257143 |
| | 17 | දික්වැල්ල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ඌරුගමුව, දික්වැල්ල | 041-2255055 |
| | 18 | නෙළුව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය පියසේන ගමගේ ගොඩනැගිලි පරිශ්‍රය, ඇඹලේගෙදර, නෙළුව | 091-3098911 |
| | 19 | අක්මීමන | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, චීනමිත්‍ර ගම්මානය, කුරුඳුවත්ත, අක්මීමන | 091-3121736 |
| | 20 | ලුණුගම්වෙහෙර | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ලුණුගම්වෙහෙර | 047-2239292 |
| | 21 | වීරවිල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වීරවිල | 047-3128444 |
| ඌව පළාත | 22 | බණ්ඩාරවෙල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, බිඳුණුවැව, බණ්ඩාරවෙල | 057-2222214 |
| | 23 | මහියංගනය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මාපාකඩවැව, මහියංගණය | 055-2257118 |
| | 24 | තණමල්විල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, 3 කණුව, බෝදාගම, සූරිය ආර, තණමල්විල | 047-3220529 |
| | 25 | කතරගම | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, පාර්ලිමේන්තු ගොඩනැගිල්ල, කඳසුරිඳුගම, කතරගම | 047-2236625 |
| | 26 | මොණරාගල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කිරිමණ්ඩල මාවත, මොණරාගල | 055-2055741 |
| | 27 | වැල්ලවාය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, යාලබෝව, වැල්ලවාය | 070-5923971 |
| | 28 | සියඹලාණ්ඩුව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මහකළුගොල්ල, සියඹලාණ්ඩුව | 071-3662328 |
| උතුරු පළාත | 29 | මුලතිව් | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, වඩ්ඩුවාකල්, මුලතිව් | 021-2290428 |
| | 30 | මන්නාරම | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, තලෙයි මන්නාරම පාර, මන්නාරම | 023-2251917 |
| | 31 | වව්නියාව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ඉරට්ටෙපෙරියකුලම, වවුනියාව | 024-2054558 |

| පළාත | අනු. අංකය | මධ්‍යස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|
| වයඹ පළාත | 32 | කුලියාපිටිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, දෙගම්මැද, කුලියාපිටිය | 037-2283680 |
| | 33 | වාරියපොල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, උසාවිය පාර, වාරියපොල | 037-2268375 |
| | 34 | මාවතගම | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ඩෙන්වොර් වත්ත, මාවතගම | 037-2298668 |
| | 35 | පඬුවස්නුවර | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, නුගවෙල හන්දිය, තුත්තිරිපිටිය, පඬුවස්නුවර | 037-2291803 |
| | 36 | දොඩම්ගස්ලන්ද | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, අලකොලමඩ, දෙඩන්ගස්ලන්ද | 037-2252655 |
| | 37 | නාත්තණ්ඩිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, සාගරගම, නාත්තන්ඩිය | 032-2050815 |
| | 38 | වෙන්නප්පුව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කමලසිරි මාවත, බෝලාන, වයික්කාල, වෙන්නප්පුව | 031-2277199 |
| | 39 | අලව්ව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, විලගමුව, අලව්ව | 070-3965010 |
| නැගෙනහිර පළාත | 40 | කුච්චවේලි | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, සලප්පාරු, කුච්චවේලි | 026-222 8709 |
| | 41 | ගෝමරන්කඩවල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, විල්පනාකුලම, ගැමුණුපුර, ගෝමරන්කඩවල | 026-4549428 |
| | 42 | අම්පාර | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කොට්ඨාස අධ්‍යාපන කාර්යාල ගොඩනැගිල්ල, උහන පාර, අම්පාර | 063-224810 |
| | 43 | සේරුවාවිල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, සේරුවිල සිරිදූව, සේරුනුවර | 026-4549439 |
| | 44 | ත්‍රිකුණාමලය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, අංක 49/3, 4 කණුව, චීනවරාය, ත්‍රිකුණාමලය | 026-4549432 |
| | 45 | දෙහිඅත්තකණ්ඩිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ලිහිණියාගම, දමනේවෙල, දෙහිඅත්තකණ්ඩිය | 027-2056723 |
| | 46 | වාලච්චේන | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, 18 වන සැතපුම් කණුව, කල්කුඩා, වාලච්චේන | 065-3121 085 |
| සබරගමුව පළාත | 47 | කෑගල්ල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, සර් ෆ්‍රැන්සිස් මොලමුරේ මාවත, ගංගොඩවත්ත, කෑගල්ල | 035-2223260 |
| | 48 | නිවිතිගල | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, අම්බලන්දෙනිය, වටාපත පාර, නිවිතිගල | 045-2279970 |
| | 49 | ගලිගමුව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ආසියාදෙනිය, ගලිගමුව | 035-2282993 |
| | 50 | ඇඹිලිපිටිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ගම්උදා භූමිය, යෝධගම, ඇඹිලිපිටිය | 047-2262399 |
| | 51 | බලංගොඩ | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, බටුගම්මන, බලංගොඩ | 045-3129898 |
| | 52 | දෙහිඕවිට | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, කනංගම, දෙහිඕවිට | 036-2267671 |

| පළාත | අනු. අංකය | මධ්‍යස්ථානය | ලිපිනය | දුරකථන අංකය |
|---|---|---|---|---|
| උතුරු මැද පළාත | 53 | කැකිරාව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මහවැලි සංකීර්ණය, කැකිරාව | 025-2263297 |
| | 54 | මැදිරිගිරිය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, යාය 03, නව නගරය පාර, මැදිරිගිරිය | 027-2050477 |
| | 55 | ගලෙන්බිඳුණුවැව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, මොගොඩවැව, යකල්ල | 025-2258355 |
| | 56 | කලා වැව | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, ගල්නෑව, බුල්නෑව, කලාවැව | 025-2269946 |
| | 57 | අනුරාධපුරය | ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථානය, පාලඩිකුලම්, අනුරාධපුරය | 025-3852809 |

02-53

---

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්‍ෂණ ඛණ්ඩ 02 සේවා ගණයේ දුම්රිය තාක්‍ෂණික කළමනාකරණ සහකාර යාන්ත්‍රික සහ දුම්රිය තාක්‍ෂණික කළමනාකරණ සහකාර විදුලි තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2021**

Open Competitive Examination for Recruitment to Grade III of Railway Technological Management Assistant (Mechanical) and Railway Technological Management Assistant (Electrical) in Management Assistant Technological Service Category Segment - 2- 2021

1. පහත තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා පුහුණු කාලසීමාවට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- දුම්රිය තාක්‍ෂණික කළමනාකරණ සහකාර යාන්ත්‍රික තනතුරේ පුරප්පාඩු - 136
- දුම්රිය තාක්‍ෂණික කළමනාකරණ සහකාර විදුලි තනතුරේ පුරප්පාඩු - 17

2. දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයෙන් අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්‍ෂණයට යොමු කර, තරග විභාගයෙන් හා සම්මුඛ පරීක්‍ෂණයේ දී ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

3. *වයස් සීමාව :*
ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

4. *බඳවා ගැනීමේ කොන්දේසි :*
ප්‍රථමයෙන්ම වසරක පුහුණු කාලසීමාවක් සඳහා බඳවාගෙන, එම පුහුණුව සාර්ථකව නිම කරන නිලධාරීන් III වන ශ්‍රේණියට බඳවාගනු ලැබේ.

*පුහුණු කාලසීමාවට බඳවා ගැනීම සඳහා සුදුසුකම්-*

*අධ්‍යාපන සුදුසුකම් :*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.;

සහ

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා විෂය ධාරාවෙන් සියළුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්‍ෂණය හැර) සමත්ව තෘතීයික අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

2017.06.15 දින වන විට ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයේ පුහුණු පාඨමාලා සඳහා ඇතුළත් කරගෙන ඇති පුහුණුලාභීන් සඳහා පමණක් අදළ පාඨමාලා සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව

ලබා දෙනු ලබන පුහුණු සහතිකය ලබා ඇත්නම් ඉහත අධ්‍යාපන සුදුසුකම් නොසලකා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.

*වෘත්තීය සුදුසුකම් :*
ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයෙන් තනතුරට අදාළව පහත සඳහන් ක්ෂේත්‍රයක වසර 2 1/2 කට නොඅඩු පූර්ණ කාලීන කාර්මික පාඨමාලාවක් හදාරා සහතික පත්‍ර ලබා ඇති අයෙකු වීම.

ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පී පාඨමාලාව
පැස්සුම් ශිල්පී පාඨමාලාව
විදුලි ශිල්පී (බල) පාඨමාලාව
යන්ත්‍ර ශිල්පී (සාමාන්‍ය) පාඨමාලාව

5. *වැටුප් පරිමාණය :*
III ශ්‍රේණිය
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 යටතේ MT-02-2016
රු. 30,140-10x350-11x370-10x560-10x660-රු. 49,910

*පුහුණු කාල සීමාව :*
මාසික දීමනාව : 2021.01.01 - 2021.12.31 දින දක්වා - මාසික දීමනාව (රු. 25,790) (ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතියට යටත්ව)

6. *බඳවා ගැනීමේ ක්‍රමය :*
පුහුණු කාල සීමාවට බඳවා ගැනීමේ ලිඛිත විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

අයදුම්කරු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන නීති රීති වලට හා විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදුවනු ඇත.

➢ *පුහුණු කාල සීමාවට බඳවා ගැනීමේ ලිඛිත විභාග යේ විෂයයන් :*

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 02 | තාක්ෂණ විෂය | පැය 02 | 100 | 40 |

විෂය නිර්දේශය :

01. *සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය.*-අපේක්ෂකයා වාසය කරන හා සේවය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනමය දැනුම හා ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත්වන නූතන කරුණු මෙන්ම ඓතිහාසික කරුණු ද, විද්‍යාත්මක, භෞතික හා කාර්මික සංවර්ධනය හා සම්බන්ධ අපේක්ෂකයෙකු සතු දැනුම හා අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය, නිවැරදි සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනීම හා බුද්ධිය පිළිබඳ මැනීමක් කිරීම අරමුණු කොටගෙන ගණිත ගැටළු, සාමාන්‍ය දැනීම හා පරිසරය ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් ව්‍යුහගත මාදිලියේ ලිඛිත විභාග යකි.

02. *තාක්ෂණ විෂය.*-තනතුරට අදාළව දැනගත යුතු මූලික තාක්ෂණික න්‍යායික දැනුම මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

➢ *පුහුණු කාල සීමාවට බඳවා ගැනීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :*

ලිඛිත තරග විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කර තරඟ විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව අයදුම්පත් කැඳවන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>හදරා ඇති ඉංග්‍රීසි/දෙමළ භාෂා, පරිඝනක සහ වෙනත් පාඨමාලා | 20 |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම්<br>වෘත්තීයට අදාළව හදරා ඇති වෙනත් වෘත්තීය පාඨමාලා<br>(මාස 06 සහ මාස 06කට වැඩි පාඨමාලා සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.) | 30 |
| 3. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද<br>වසරකට ලකුණු 06 බැගින් උපරිම වසර 05ක් සඳහා සලකා බලනු ලැබේ. | 30 |
| 4. විශේෂ/බාහිර දක්ෂතා<br>ක්‍රීඩා/සමාජ සේවා යනාදී | 15 |
| 5. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද ආකල්ප හා පෞරුෂය | 05 |
| එකතුව | 100 |

*පුහුණු කාලසීමාවෙන් පසුව III ශ්‍රේණියට බඳවා ගැනීමේ ක්‍රමය* :

පුහුණු කාලය සඳහා බඳවා ගන්නා ලද පුහුණුලාභීන් පුහුණුව අවසානයේදී ලිඛිත හා ප්‍රායෝගික පරීක්‍ෂණයකට යොමු කර සමත් වූ අය III ශ්‍රේණියට පත් කරනු ලැබේ. පළමුවර පුහුණුව අවසන් පරීක්‍ෂණය අසමත් වූ අයට නැවත පැවැත්වෙන පුහුණු අවසන් පරීක්‍ෂණය සඳහා පෙනී සිටීම සඳහා අවස්ථා 02ක් ලබාදෙන අතර ඉන් අසමත් වන අයගේ සේවය අවසන් කරනු ලැබේ.

*පුහුණු කාල සීමාවෙන් පසු III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත විභාගයේ විෂයයන්* :

එක් ප්‍රශ්න පත්‍රයකින් පමණක් සමන්විත වේ.

| | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | තාක්‍ෂණ විෂය | පැය 02 | 100 | 40 |

*විෂය නිර්දේශය* :

*තාක්‍ෂණ විෂය*.- තනතුරට අදාළව තාක්‍ෂණ විෂය සම්බන්ධයෙන් දැනුම මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

*පුහුණු කාල සීමාවෙන් පසු III ශ්‍රේණියට බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්‍ෂණය* :

| | *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | තාක්‍ෂණ විෂය | 100 | 60 |

*විෂය නිර්දේශය* :

*තාක්‍ෂණ විෂය*.- තෝරා ගත් විෂය පිළිබඳ නිපුණතාවය සහ තනතුරට අදාළව න්‍යායික දැනුම ප්‍රායෝගිකව හා නිවැරදිව භාවිතයට ගනු ලබන්නේ දැයි මැන බැලීම සඳහා ප්‍රායෝගික පරීක්‍ෂණයක් පවත්වනු ලැබේ.

07. *සේවා කොන්දේසි* :

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.)
සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යටත් වනු ඇත.

*සේවා ගිවිසුම පිළිබඳ විස්තර* :

පුහුණු කාලසීමාවට බඳවා ගෙන III ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් III ශ්‍රේණියට පත්වීම ලද දින සිට වසර 10 ක කාලයක් අනිවාර්යයෙන් ම දුම්රිය දෙපාර්තමේන්තුවට සේවය කළ යුතුය. එසේ වසර 10 ක සේවයට පෙර ඉවත්ව නොයන බවටත් ඊට පෙර සේවයෙන් ඉවත්ව යන්නේ නම් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් නිර්දේශ කරනු ලබන මුදලක් දෙපාර්තමේන්තුවට ගෙවීමට එකඟ බවටත් රජයේ සේවකයෙකු ඇපකරුවෙකු වශයෙන් ඉදිරිපත් කර වගකීමකට බැඳිය යුතුය.

III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය.

තෝරා ගනු ලබන්නන් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක -: PSC/EST/04 -01-43/09/2016 හා 2017.06.15 දිනැතිව අනුමත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමණාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 2 සේවා බණ්ඩය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියෙහි පනවා ඇති නියමයන් හා කොන්දේසි වලටද, එම පරිපාටියට කර ඇති හෝ මින්මතු කරන සංශෝධනවලටද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලටද, අංක 1589/30 හා 2009.02.20 වැනි දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලටද, දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසිවලටද යටත් විය යුතුය.

තෝරාගනු ලබන්නන් නියමිත වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් වීමට අමතරව දුම්රිය දෙපාර්තමේන්තු උපදෙස් මාලාවට අනුව, තනතුරට අදාළව සමත්විය යුතු විශේෂ දෘෂ්ඨි පරීක්ෂණයෙන් ද සමත් විය යුතුය.

08. *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්* :

ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද් දී හෝ විභාග යෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගිය හොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන. අයදුම්කරුවෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

09. *විභාග ගාස්තුව* :

විභාග ගාස්තුව රු. 750.00 කි. මෙම මුදල අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට දුම්රිය සාමාන්‍යාධිකාරීගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-100129027-313 ට බැරවෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට් පත අයදුම්පතේ අදළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

10. *අයදුම් කළ යුතු ක්‍රමය :*

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදසියේ දෙපැත්ත භාවිතා කරමින් ඒ4 (A4) ප්‍රමාණයේ කඩදසියක, අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 2.12 තෙක් පළමුවන පිටුවට ද, 3.0 සිට 5.0 තෙක් එහි දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද, වන පරිද්දෙන් තම අයදුම්පත්‍රය සකස් කල යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කල හැකිය. අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව පිරවිය යුතු අතර ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම විභාග නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසිලිමත් විය යුතු වේ. එසේ නොවුනහොත් එය ප්‍රතික්ෂේප විය හැකිය.

(ආ) අයැදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් ම අයදුම්පත්‍රය සම්පූර්ණ කල යුතු ය. අයැදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයැදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(ඇ) විභාගය සඳහා වන නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් 2021.03.05 වැනි දින හෝ ඊට කලින් හෝ ලැබෙනු පිණිස එවිය යුතුය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ, වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව "ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ - 02 සේවා ගණය සඳහා වන දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර තනතුරු සඳහා විවෘත ධාරාව යටතේ පුහුණු කාලසීමාවට සුදුස්සන් තෝරා ගැනීමේ තරඟ විභාගය - 2021" හා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයෙන් හදාරා ඇති පාඨමාලාව සහ වර්ෂය සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරී,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
පත්වීම් ශාඛාව,
තැ. පෙ. 355,
ඕල්කොට් මාවත, කොළඹ 10.

(ඈ) අයදුම්පත්‍රයේ අයැදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කල තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඊ) අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දුම්රිය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් හෝ ගත වූ පසුවත් විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කල විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමඟ ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සටහන් කොට ඉල්ලීම් ලිපියක් නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මගින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින්ම විමසීම වඩාත්, ඵලදායී වනු ඇත. තවද, දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සූදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(උ) කිසියම් අයදුම්කරුවෙකු වෙත විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

11. අයදුම්කරුවන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
- වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම් කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත. තවද සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එම්. ජේ. ඩී. ප්‍රනාන්දු,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2021 ජනවාරි මස 25 වැනි දින.

ආදර්ශ අයදුම්පත

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 02 සේවා ගණය සඳහා වන දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර තනතුරු සඳහා විවෘත ධාරාව යටතේ පුහුණු කාලසීමාවට සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගය - 2021**

Open Competitive Examination for Recruitment to Grade III of Railway Technological Management Assistant (Mechanical) & Railway Technological Management Assistant (Electrical) in Management Assistant Technological Service Category Segment - 2- 2021

1.0 මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : ☐
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදළ අංකය කොටුව තුල ලියන්න) අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.)

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :————.
(උදා : GUNAWARDHANA, H.M.S.K.)

2.3 සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :————.

2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.6 ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ - 0 ස්ත්‍රී - 1 අදළ අංකය කොටුව තුළ ලියන්න ☐

2.7 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

2.8 විවාහක/අවිවාහක බව : අදළ අංකය කොටුව තුළ ලියන්න

අවිවාහක - 1
විවාහක - 2 ☐

2.9 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියන් දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5) -
අදළ අංකය කොටුව තුළ ලියන්න. ☐

2.10 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

2.11 සුදුසුකම් සැපිරිය යුතු ............... දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

2.12 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

3.0 සුදුසුකම් ඃ

3.1 අධ්‍යාපන සුදුසුකම් - අ.පො.ස. (සා.පෙළ)

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *සමාර්ථය* |
|---|---|
| 1. .................. | .................. |
| 2. .................. | .................. |
| 3. .................. | .................. |
| 4. .................. | .................. |
| 5. .................. | .................. |
| 6. .................. | .................. |
| 7. .................. | .................. |
| 8. .................. | .................. |

අ.පො.ස. (උ.පෙළ)

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. .................. | .................. |
| 2. .................. | .................. |
| 3. .................. | .................. |

3.2 ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයෙන් හදරා ඇති,

කාර්මික පාඨමාලාවේ නම :————.

පාඨමාලාවේ කාලය : වසර [ ]

............. දින සිට ............ දින දක්වා

*සැ. යු.*- ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයේ අවසන් සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපතක් මේ සමග අමුණා එවීම අනිවාර්ය වේ.

4.0 මුදල් ගෙවූ මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපත මනා ලෙස අලවන්න.

| |
|---|
| මුදල් තැන්පතු පත්‍රිකාවේ (මුල් පිටපත) නොගැලවෙන ලෙස එහි එක් දරයක් මෙහි අලවන්න. (මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |

5.0 අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ......... හා ......... වැනි දින දරන මුදල් තැන්පතු පත්‍රිකාව මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගිය හොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (*ගැසට් නිවේදනයේ* 10 (ඇ) පරිදි විය යුතු ය.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ......... (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව යොදා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ......... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.

(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතු ය)

7.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ....................... මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................. ලෙස සේවය කරන අතර ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශකර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ හැකි ය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
දිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතු ය)

02-139

---

## වාරිමාර්ග අමාත්‍යාංශය

### වාරිමාර්ග දෙපාර්තමේන්තුව
### තාක්ෂණ සහායක (යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීම සඳහා
### පවත්වනු ලබන විවෘත තරඟ විභාගය - 2020

වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 3 සේවා ගණයේ තාක්ෂණ සහායක (යාන්ත්‍රික) තනතුර සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1. *බඳවා ගැනීමට අපේක්ෂිත තනතුර* :

| තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | බඳවා ගන්නා ශ්‍රේණිය |
|---|---|---|
| තාක්ෂණ සහායක (යාන්ත්‍රික) | 08 | III ශ්‍රේණිය |

1.2. *තනතුරේ රාජකාරී ස්වභාවය* :

| තනතුරු නාමය | පැවරෙන කාර්යයන් |
|---|---|
| තාක්ෂණ සහායක (යාන්ත්‍රික) | යාන්ත්‍රික වැඩපලට අලුත්වැඩියාව සඳහා පැමිණෙන යන්ත්‍ර හා වාහන භාර ගැනීම.<br><br>යාන්ත්‍රික අංශයට අනුයුක්ත කනිෂ්ඨ සේවකයින්ගේ රාජකාරී අධීක්ෂණය |

2. *බඳවා ගැනීමේ ක්‍රමය* :

2.1. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත තරඟ විභාග යක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාවය හා සහතික පත්‍ර පරීක්ෂා කර බැලීම සඳහා

වන අතර, සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

3. *වැටුප් පරිමාණය :*

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන I අනුව රු. 29840-10x300-11x350-10x560-10x660- රු.48,890/- වේ. (MT1 -2016)

4. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :*

4.1. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. අදාළ විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.

4.2. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. තාක්ෂණ සහායක III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

4.3. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 අනුව තනතුරට බැඳී වසර 03 ක් ඇතුළත තමන්ට නියමිත අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව අදාළ ප්‍රවීනතාවය ලබා ගත යුතුය.

4.4. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපරිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලටද මෙම පත්වීම යටත් වේ.

5. *වයස් සීමාව :*
අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර,උපරිම වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

6. *අවශ්‍ය සුදුසුකම් :*

6.1. *අධ්‍යාපන සුදුසුකම් :*

6.1.1. භාෂාව හෝ සාහිත්‍ය, ගණිතය සහ විද්‍යාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06)අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

6.2. *වෘත්තීය සුදුසුකම් :*

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික විද්‍යාලයකින් තුන් අවුරුදු අර්ධ කාලීන ජාතික තාක්ෂණ සහතික පත්‍ර (යාන්ත්‍රික) පාඨමාලාව සමත් වී අදාළ සහතිකය (NCT - Mechanical) ලබා ගෙන තිබීම හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක් විසින් නිකුත් කරන ලද ඊට සමාන සහතිකයක් ලබා ගෙන තිබීම.

6.3. *කායික සුදුසුකම් :*

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

6.4. *වෙනත් සුදුසුකම් :*

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
III. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ,අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

7. *සාවද්‍ය තොරතුරු සැපයීම :*

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

8. *විභාග පරිපාටිය :*

විභාගය විෂයයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල සහ දෙමළ මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 01 | 100 | 40 |

8.1. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

1. *බුද්ධි පරීක්ෂණය :*

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකුලතාවයත්, සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත්, තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ. |

2. *විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය :*

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | මූලික ගණිතමය දැනුම හා මූලික යාන්ත්‍රික ඉංජිනේරුමය දැනුම පරීක්ෂා කිරීම සඳහා වන ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |

8.2. මෙම විභාගය 2021 අප්‍රේල් මස කොළඹ දිස්ත්‍රික්කය තුළදී සහ තෝරා ගත් දිස්ත්‍රික්ක කිහිපයකදී පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීම පිළිබඳ අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේය.

9. *අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :*

9.1. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී 21x29 ( ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කර ගත යුතුය. අංක 1 සිට 6 දක්වා ශීර්ෂ 01 පිටුවේද, අංක 7 සිට 11 දක්වා 02 පිටුවේද ,අංක 12 සිට 14 දක්වා 03 පිටුවේද, අංක 15, 04 පිටුවේද ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතුය.

9.2. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ද රාජ්‍ය සංස්ථා පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානීන් මගින් ද නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු වේ.

9.3. අයදුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන්ය.

9.4. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිඳු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.5. අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේ දී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

9.6. තරඟ විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

9.7. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ" වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සහායක (යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

9.8. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

9.9. මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියළුම කරුණු පිළිබඳව අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේය.

10. *අයදුම්පත් යොමු කිරීම :*

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2021මාර්තුමස 05 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
230, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

11. *විභාගයට පෙනී සිටීම :*
විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාග යට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදීම විභාගයට පෙනී සිටිය යුතුය.

12. *අපේක්ෂකයාගේ අනන්‍යතාවය :*
විභාග ශාලාවේදී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

13. මෙම ගැසට් නිවේදනයේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

ඉංජි. කේ. ඩී. නිහාල් සිරිවර්ධන,
වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්.

2021 පෙබරවාරි මස 02 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

**වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවත්නා**
**තාක්ෂණ සහායක (යාන්ත්‍රික) තනතුරට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන**
**විවෘත තරඟ විභාගය - 2020**

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි.)

1. විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

 සිංහල - 1
 දෙමළ - 2
 (අදාළ කොටුව තුළ ලියන්න)

2. අයදුම්කරනු ලබන තනතුරු නාමය :————.

3. මුලකුරු සමඟ නම (මුලකුරු අගට යොදා) : (මයා/මිය/මෙනෙවිය)

 සිංහලෙන් / දෙමළෙන් :————.
 ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.
 (උදා. PERERA, A.B.C)

 3.1. සම්පූර්ණ නම :
 සිංහලෙන් / දෙමළෙන් :————.

 ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :

5. ස්ත්‍රී /පුරුෂ භාවය (අදාළ කොටුව තුළ ලියන්න)
 පුරුෂ - M
 ස්ත්‍රී - F

6. ස්ථිර ලිපිනය : (පැහැදිලි අකුරින්)
 සිංහලෙන්/ දෙමළෙන් :————.
 ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.

 6.1. ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :
 සිංහලෙන්/ දෙමළෙන් :————.
 ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.

7. දුරකථන අංකය : ස්ථාවර :————. ජංගම :————.

8. පදිංචිය :
 8.1. පදිංචි දිස්ත්‍රික්කය :————.
 8.2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

9. විවාහක / අවිවාහක බව :

 අවිවාහක - 1 විවාහක - 2

10. උපන් දිනය ඃ

වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

10.1. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට (2021.03.05 දිනට) වයස ඃ

අවුරුදු [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

11. අධ්‍යාපන සුදුසුකම් ඃ

11.1. අ.පො.ස (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර ඃ
පළමු වන වර

I. විභාගයේ වර්ෂය හා මාසය :————.
II. විභාග අංකය :————.
III. ප්‍රතිඵල ඃ

| | විෂය | ශ්‍රේණිය | | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

11.2. අ.පො.ස (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර ඃ
දෙවන වර

I. විභාගයේ වර්ෂය හා මාසය ඃ .........................................................
II. විභාග අංකය ඃ .........................................................
III. ප්‍රතිඵල ඃ

| | විෂය | ශ්‍රේණිය | | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|---|---|
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

12. වෘත්තීය සුදුසුකම් ඃ

| හදාරා ඇති පාඨමාලාව | පිරිනමනු ලැබූ ආයතනය | හදාරා ඇති කාල සීමාව | සහතික පත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|
| | | | |

අදාළ සහතිකයේ පිටපතක් අමුණන්න.

13. අයදුම්කරුගේ සහතිකය ඃ

.................................... වන මම මෙහි සඳහන් කරන සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබ හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා නොමැති බවත් සහතික කරමි. මෙහි ඇතුළත් කරුණු

කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්ත්වයක් අනාවරණය වුවහොත් කිසිඳු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි.මා මෙම තනතුරට තෝරා පත් කර ගනු ලැබුවහොත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක වාරිමාර්ග ක්ෂේත්‍රයේ වැඩ බිම්වල රාජකාරි කිරීමට එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

14. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත්‍ර ඉදිරිපත් කරනු ලබන .................................... මයා/මිය/මෙනෙවිය , මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ ඇය .................. වැනි දින මා ඉදිරිපිටදී ඉහත 13 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

15. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ ආයතන ප්‍රධානියාගේ සහතිකය : (දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)

......................................... මයා/මිය/මෙනෙවිය ................. සේවයේ නියුතු ..................... තනතුර දරන නිලධාරියෙකු බවත්, ඔහු/ඇය ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු /ඇය තෝරා ගනු ලැබුවහොත්, ..................... සේවයෙන් ඔහු/ ඇය මුදා හැරිය හැකි /නොහැකි බවත් වැඩි දුරටත් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ආයතන
ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

දිනය :————.

02-336

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | | *තැපැල් ගාස්තුව* | |
|---|---|---|---|---|
| | *රු.* | *ශ.* | *රු.* | *ශ.* |
| I වැනි කොටස : | | | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 | 0 | 9,340 | 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 | 0 | 950 | 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 | 0 | 750 | 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 | 0 | 2,500 | 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 | 0 | 450 | 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 | 0 | 275 | 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 | 0 | 4,360 | 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 | 0 | 3,640 | 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 | 0 | 1,250 | 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 | 0 | 5,520 | 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | | **තැපැල් ගාස්තුව** | |
|---|---|---|---|---|
| | *රු.* | *ශ.* | *රු.* | *ශ.* |
| I වැනි කොටස : | | | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 | 0 | 60 | 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 | 0 | 60 | 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 | 0 | 60 | 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 | 0 | 120 | 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 | 0 | 60 | 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 | 0 | 60 | 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 | 0 | 60 | 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 | 0 | 60 | 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 | 0 | 60 | 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සලකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2021 වර්ෂය** | | | |
| පෙබරවාරි | 2021.02.05 | සිකුරාදා | 2021.01.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.02.12 | සිකුරාදා | 2021.01.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.02.19 | සිකුරාදා | 2021.02.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.02.25 | බ්‍රහස්පතින්දා | 2021.02.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| මාර්තු | 2021.03.05 | සිකුරාදා | 2021.02.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.03.12 | සිකුරාදා | 2021.02.25 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.03.19 | සිකුරාදා | 2020.03.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.03.26 | සිකුරාදා | 2020.03.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2021.04.01 | බ්‍රහස්පතින්දා | 2021.03.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.04.09 | සිකුරාදා | 2021.03.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.04.16 | සිකුරාදා | 2021.04.01 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.04.23 | සිකුරාදා | 2021.04.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.04.30 | සිකුරාදා | 2021.04.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.